සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 1 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ............................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

01. ශුද්ධ බයිබලයේ පොත් 17 ක් අඩංගු පොත් කාණ්ඩය වනුයේ,
 1. නීති පොත් 2. දිවැසිවර පොත් 3. ඉතිහාස පොත් 4. ප්‍රඥා පොත්

02. පාවුලු තුමා විසින්ම ලියන ලද ග්‍රන්ථයකි,
 1. එපීස 2. 1 තිමති 3. රෝම 4. තීතස්

03. එළිදරව් සාහිත්‍යයේ කළු වර්ණයෙන් සංකේතවත් වන්නේ,
 1. ජයග්‍රහණය 2. සාගතය 3. යුද්ධය ලේ වැගිරීම් 4. මරණය

04. ප්‍රඥාවන්තව කටයුතු කිරීම යනු
 1. එදිනෙදා ජීවිතය තුළ යහපත පමණක් තෝරාගෙන ජීවත් වීමයි.
 2. හැම විටම දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමයි.
 3. නිතරම සත්‍යය ප්‍රකාශ කරමින් ජීවත් වීමයි.
 4. ශුද්ධ වූ සභාවේ පනත් අනුව ජීවත් වීමයි.

05. මුල් කිතුනු සභාවේ ලක්ෂණයක් වන්නේ,
 1. යාච්ඤාව 2. ඒකත්වය 3. අපෝස්තලිකත්වය 4. ශුද්ධත්වය

06. අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා ලෙස හඳුන්වන්නේ,
 1. ශුද්ධ වූ ලූක්තුමා 2. ශුද්ධ වූ අගුස්තිනුතුමා
 3. ශුද්ධ වූ පාවුලුතුමා 4. ශුද්ධ වූ ජුසේවාස් පියතුමා

07. අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා කතෝලික සභාවේ ............. වන ශුද්ධෝත්තම පියතුමාය.
 1. 266 2. 232 3. 246 4. 256

08. නීරෝ අධිරාජ්‍යයා විසින් ශුද්ධ වූ පාවුලුතුමාගේ හිස ගසා මරා දමන ලද්දේ,
 1. ක්‍රි.ව. 58 දී ය. 2. ක්‍රි.ව. 68 දී ය. 3. ක්‍රි.ව. 48 දී ය. 4. ක්‍රි.ව. 70 දී ය.

09. ''දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය'' ලෙස හඳුන්වනු ලබන්නේ,
 1. පාපොච්චාරණය 2. අභිවෘද්ධි ආලේපය 3. පූජකවරය 4. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

10. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වන්නේ,
 1. දස පනතට අනුව දිවි ගෙවීම 2. ජෙරුසලමේ දේව මාලිගාවට යාම
 3. ව්‍යවස්ථාව පිළිපැදීම 4. යාග පූජා පුද කිරීම

11. නැගෙනහිර හා බටහිර ජර්මනිය වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වූයේ,
 1. ශුද්ධ වූ මැක්සිමිලියන් කොල්බේ මුනිතුමා. 2. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා.
 3. ගරු මයිකල් රුදිගු නි.ම.නි පියතුමා. 4. අති උතුම් විසිතුන්වන ජුවාම් පාවුලු මුනිතුමා.

12. සාලෙම් නුවරදී ප්‍රථම වරට පූජා හා මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළේ,
1. දාවිත් රජතුමා ය. 2. සාමුවෙල් ය. 3. ජෝෂුවා ය. 4. මෙල්කිසදෙක් ය.

13. "ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට පමණක් ගරු බිය පෑ යුතුය, ඔවුන් වහන්සේට පමණක් ............... කළ යුතුය". හිස් තැනට සුදුසු වචනය වන්නේ,
1. ප්‍රශංසාව 2. යාච්ඤා 3. වැඳුම් පිදුම් 4. ස්තුතිය පුද

14. "මාගේ පුත්‍රය, පියාගේ අවවාදය අසන්න; මවගේ උපදෙස් ඉවත නොදමන්න" මෙසේ සඳහන් වන්නේ,
1. උපදේශකයා හෙවත් සිරාක් ග්‍රන්ථයේ ය. 2. කොලොස්සි ග්‍රන්ථයේ ය.
3. ගීතාවලියේ ය. 4. හිතෝපදේශයේ ය.

15. "අන් අයගේ අයහපත ගැන සතුටු වීම" කුමන පනතට විරුද්ධ පාපයක් වන්නේද?
1. දසවන පනතට 2. පස්වන පනතට 3. අටවන පනතට 4. හයවන පනතට

16. දෙපළ දෙවියන් වහන්සේ මිනිසාට ලබාදී ඇත්තේ .................... ය. හිස්තැනට වඩාත් සුදුසු වචනය වන්නේ,
1. මිනිසාට බුක්ති විඳීමට 2. මිනිසාට සේවය කිරීමට
3. මිනිසාට සතුටු වීමට 4. මිනිසාට අයිති කරගන්නට

17. චතාරික සහ පාස්කු සමයේ කියවනු ලබන සුබාරංචිය වන්නේ,
1. මාක් සුබාරංචිය 2. ලූක් සුබාරංචිය 3. මතෙව් සුබාරංචිය 4. ජොහන් සුබාරංචිය

18. නිළ වශයෙන් ජනවන්දනා වර්ෂය ආරම්භ වන්නේ,
1. ආගමන කාලයේ පළමු ඉරුදිනෙන්
2. ක්‍රිස්තුස් වහන්සේගේ උප්පත්ති මංගල්‍යයෙන්
3. සාමාන්‍ය සමයේ පළමු ඉරුදිනෙන්
4. පාරිශුද්ධ දේවමාතා මංගල්‍යයෙන්

19. ශුද්ධ වූ සතියට අයත් කාල සීමාව වනුයේ,
1. අළු බදාදා සිට පාස්කු ඉරුදින දක්වා 2. ගොබ් ඉරුදින සිට මහ සිකුරාදා දක්වා
3. ගොබ් ඉරුදින සිට පාස්කු ඉරිදා දක්වා 4. ගොබ් ඉරුදින සිට ආලේලූයියා සෙනසුරාදා දක්වා

20. ජනවන්දනාව තුළ දම් වර්ණයෙන් අර්ථ ගන්වන්නේ,
1. මහිමාන්විත බව සහ බලාපොරොත්තුව අරුත් ගැන්වීමයි.
2. නව ජීවනය සහ වර්ධනය යන අර්ථය යි.
3. පරිත්‍යාගී බව සහ ඇදහිල්ලට සාක්ෂි දැරීමයි.
4. පශ්චාත්තාපයේ සහ බලාපොරොත්තුවේ ලකුණකි.

21. "මහෝත්තම ස්වාමීන් වන දෙවියන් වහන්සේ මා ලාබාලයෙකු වන බැවින් මම කථා කරන්නට නොදනිමි" යනුවෙන් පවසන ලද්දේ,
1. මෝසෙස්තුමා ය. 2. ජෙරමියා දිවැසිවරයා ය.
3. එසකියල් දිවැසිවරයා ය. 4. යෙසායා දිවැසිවරයා ය.

22. මාක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නමක් වන්නේ,
1. ශුද්ධ වූ සභාවේ ශුභාරංචිය 2. අධ්‍යාත්මික ශුභාරංචිය
3. දයාවේ ශුභාරංචිය 4. දුක් ප්‍රාප්තියේ ශුභාරංචිය

23. උත්පත්ති පොතේ තුන්වන පරිච්ඡේදයේ දැක්වෙන සර්පයාගෙන් සංකේතවත් කරන්නේ,
1. මිනිසා තුළ ඇති බලය යි. 2. මිනිසාගේ අහංකාරකම යි.
3. මිනිසා තුළ අති රුචිය යි. 4. මිනිසා පාපයට දක්වන ඇල්මයි.

24. අත්තික්කා කොළ ඇඳ සිටි මිනිසාට හම වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේගේ,
A = බලයයි
B = කරුණාවයි
C = සත් ගුණවත් භාවයයි
D = ආදරයයි
E = රැකවරණයයි

මින් නිවැරදි පිළිතුරු වන්නේ,
1. A, B හා C ය. 2. A, C හා E ය. 3. B, C හා D ය. 4. B, D හා E ය.

25. ඔහුගේ පරම්පරාවේ නිදොස් මිනිසා ඔහු ය. මෙසේ සඳහන් වන්නේ,
1. නෝවා ගැන ය.
2. ඊසාක්තුමා ගැන ය.
3. ආබ්‍රහම්තුමා ගැන ය.
4. මෝසෙස්තුමා ගැන ය.

26. වසංගත 6, 7, 8 අනුපිළිවලට සඳහන් වන්නේ,
1. ගඩු උවදුර / ගල් වර්ෂාව / පළගැටි උවදුර
2. ගඩු උවදුර / පළගැටි උවදුර / ගනඳුරු උවදුර
3. ගල් වර්ෂාව / පළගැටි උවදුර / ගඩු උවදුර
4. ගව සම්පත් වැනසීම / ගල් වර්ෂාව / පළගැටි උවදුර

27. "මා මෙය දැන ගන්නේ කෙසේද මම මහල්ලෙක්මි, මාගේ භාර්යාව ද වයස්ගතව සිටී" මෙසේ පැවසුයේ,
1. ආබ්‍රහම්තුමා ය.
2. ජෝෂුවාතුමා ය.
3. ආරොන්තුමා ය.
4. සෙකරියස්තුමා ය.

28. දේව රාජ්‍යය යනු,
1. දේවපාලනය යි.
2. දේව කැමැත්තට හා දේව පාලනයට නතුවීම ය.
3. ප්‍රතිපත්තිය හා ව්‍යවස්ථාව යි.
4. දේව දයාවේ රාජ්‍යය යි.

29. ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සංකේතාත්මක ද්‍රව්‍යයක් වනුයේ,
1. පූප සහ මිදිරස
2. ශුද්ධ වූ බයිබලය
3. සුදු වස්ත්‍රය
4. කුරුසිය

30. අභිවෘද්ධි ආලේපය මගින් ලැබෙන වරප්‍රසාදයක් වනුයේ,
1. ජන්ම හා කර්ම පාපයන්ට සමාව හා ඒවාට නියමිත දඬුවම්වලට සමාව ලැබීම.
2. ක්‍රිස්තුන් වහන්සේ සමඟ තිරසාර ව ඒකාබද්ධ කරන්නේ ය.
3. දේව දරුකම ලැබීම.
4. අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම සඳහා සුදුස්සකු වීම.

- 31 හා 32 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත කරුණු භාවිත කරන්න.

31. A – ප්‍රසාද ස්නාපනය C – අභිවෘද්ධි ආලේපය
B – පාපොච්චාරණය E – රෝගීන්ගේ ආලේපය

ඉහත සඳහන් ප්‍රසාද නිධාන අතුරින් සුවය දානය කිරීමේ ප්‍රසාද නිධාන වනුයේ,
1. B සහ E
2. A සහ D
3. A සහ B
4. A සහ C

32. ඉහත සඳහන් ප්‍රසාද නිධාන අතුරින් ආරම්භක දේව ප්‍රසාද නිධාන වනුයේ,
1. A සහ D
2. C සහ D
3. A සහ C
4. A සහ B

33. ෆ්‍රැන්ක් ඩෆ් මහතා විසින් ආරම්භ කරන ලද ගිහි සංවිධානය වනුයේ,
1. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය
2. මරිය හමුදාව
3. ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදය සමිතිය
4. සාන්ත වින්සන් ද පාවුලා සමිතිය

34. ධරණීය සංවර්ධනය යනුවෙන් හඳුන්වන්නේ,
1. සත්ත්ව පාලනය
2. දේව මැවිල්ල පාලනය කිරීම
3. සංරක්ෂණය කරමින් පරිභෝජනය කිරීම
4. රැක බලා ගැනීම

35. "ස්වාමිනි, මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව" යන සාම යැදුම නිර්මාණය කළේ,
1. කල්කටාවේ සාන්ත තෙරේසා මව්තුමිය
2. සාන්ත ලෝරන්ස් මුනිඳුන්
3. සාන්ත දෙවන ජුවාම් පාවුළු මුනිඳුන්
4. අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිඳුන්

36. එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථයක් වන්නේ,
1. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට නිසි ලෙස සූදානම් වීම
2. ශරීරය දමනය පුහුණු කිරීම
3. දන්දීම
4. යාච්ඤා කිරීම

37. නිවැරදි ප්‍රකාශයන් අඩංගුවන වරණය තෝරන්න

A – උදෑසන යාම යැදුමට සෙකරියස්තුමන්ගේ ප්‍රශංසා ගීතය භාවිතා කරයි.
B – දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පෙර යාම යැදුම "දේව කාරිය" ලෙස හඳුන්වන ලදී.
C – යාම යැදුම යදින යාමයන් 4 ක් ඇත.
D – යාම යැදුම උච්චාරණය පොදු පූජකවරයේ අනිවාර්යය වගකීමකි.

1. A, C සහ E
2. A, B සහ D
3. A, B සහ C
4. C, D සහ E

පහත දක්වා ඇත්තේ දේවමෑණියන්ගේ දර්ශනය වීම් සහ වර්ෂයන් ය. එම තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| a. 1917 | A - මැජුගෝරය |
| b. 1858 | B - ලූර්දුව |
| c. 16 වන සියවස | C - වේලක්කන්නි |
| | D - පාතිමාව |

1. D, B සහ C    2. A, B සහ D    3. D, B සහ A    4. C, B සහ A

ආත්මික පුණ්‍ය ක්‍රියා නිවැරදිව සඳහන්වන වරණය වන්නේ,
1. වහලුන් නිදහස් කිරීම/ අඥානයන්ට ඉගැන්වීම
2. මළවුන් වැළලීම/ රෝගීන් බැලීමට යාම
3. අඥානයන්ට ඉගැන්වීම/ වැරදි කමා කිරීම
4. දුකින් පෙළෙන්නන් සැනසීම/ වහලුන් නිදහස් කිරීම

ඇතුළාන්ත සාමයට මූලික වන්නේ,
1. සත්‍යය, යුක්තිය, ප්‍රේමය හා නිදහසයි.
2. සත්‍යය, ධර්මිෂ්ටකම හා යුක්තියයි.
3. සත්‍යය, ගරු කිරීම, ප්‍රේමය හා ධර්මිෂ්ටකමයි.
4. සත්‍යය, සාධාරණත්වය, ධර්මිෂ්ටකම හා ප්‍රේමයයි.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් සමග ප්‍රශ්න 5ට පිළිතුරු සැපයිය යුතුවේ.

---

1. i. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇති ස්ථානය සහ කාල වකවානුව ලියන්න.
   ii. අපෝස්තුළුවරුන් අතරින් පළමුව ප්‍රාණපරිත්‍යාගී වූ අපෝස්තුළු තුමන් කවුද? එතුමාව හිස ගසා මරා දමන ලද්දේ කවුරුන් විසින්ද?
   iii. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයෙදී සිදුකළ කාර්යයන් දෙකක් ලියා දක්වන්න.
   iv. ශුද්ධ වූ පාවුලුතුමා එපීස ලිපියේ දරුවන්ට ලබා දෙන අවවාද 2 නම් කරන්න.
   v. ජනවන්දනාව සඳහා භාවිත කරන "ලිටුර්ජියා" යන ග්‍රීක වචනය සෑදී ඇති වචන දෙක හා එහි අර්ථය ලියා දක්වන්න.
   vi. බබිලෝනියානු විප්‍රවාස ගත ජනතාව තුළ නව බලාපොරොත්තුවක් ඇති කළ එසකියල් දිවැසිවරයා තුළ තිබූ ගති ලක්ෂණ දෙක ලියන්න.
   vii. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමන් ට දුන් පොරොන්දු දෙක නම් කරන්න.
   viii. කතෝලික විවාහයේ පරමාර්ථ 2 නම් කරන්න.
   ix. ස්වාමිවාක් ආරාධනයේ අප විසින් පාප අවස්ථාවන්ගෙන් මුදන ලෙස යදින විට අප කරන්නාවූ ඉල්ලීම් දෙකක් නම් කරන්න.
   x. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව භාවනාව යනු සොයා යාමකි. සොයා යෑමේදී විමසිලිමත් විය යුතු කරුණු 2 නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

2. i. ශුද්ධ බයිබලයේ අඩංගු ඉතිහාස පොත් අතරින් සීනයි ගිවිසීමට පක්ෂපාතී වීමෙන් දේව ආශිර්වාදය සහ දියුණු වීම සිදුවන බව උගන්වන ඉතිහාස පොත් දෙකක් නම් කරන්න.
   ii. ද්වීතීය පාවුලු සංදේශ 3 නම් කරන්න.
   iii. එදිනෙදා ජීවිතයේ දී ප්‍රඥාවන්තව කටයුතු කරන්නට වරම් ඉල්ලමින් දිව්‍ය පූජාවේදී උච්චාරණය කිරීමට සුදුසු විශ්වාසකයින්ගේ යාච්ඤා 5 ක් නිර්මාණය කරන්න. (සභාවේ නායකයන්/ රටේ නායකයන්/ පවුල් ජීවිත/ තරුණ තරුණියන් සහ අධ්‍යාපනය වෙනුනේ මෙම විශ්වාසකයින්ගේ යාච්ඤා නිර්මාණය කරන්න)

(ලකුණු 2 + 3 + 5 = 10)

3. i. ස්වර්ග රාජ්‍යයේ යතුරේ හිමිකරුවාණන් ලෙස පේදුරුතුමාට හිමි වූ බලයන් 2 ක් නම් කරන්න.
   ii. ජේසුස් වහන්සේ පේදුරුතුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යභාරය ලියන්න.
   iii. ශුද්ධවූ පේදුරුතුමාගේ ජීවිතාදර්ශය තුළ පාසලේ දී සැබෑ නායකයෙකු ලෙස ඔබට කළ හැකි ක්‍රියාවන් 5 ක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

4. i. පුරවැසියෙන්ගේ වගකීම් සහ යුතුකම් 2 ක් සඳහන් කරන්න.
   ii. දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ දෙමාපියන්ගේ වගකීම් 3 ක් නම් කරන්න.
   iii. මිනිස් ජීවිතයේ වටිනාකම ආරක්ෂා කිරීමට පාසල තුළ සිසුවෙකු ලෙස ඔබට කළ හැකි දෑ 5 ක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

5. i. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇතිකර ගත් ගිවිසුම සඳහන් වන සම්ප්‍රදායන් දෙක ලියන්න.
   ii. ශුද්ධ බයිබලය තුළින් දක්නට ලැබෙන ගිවිසුම සාමාන්‍ය සමාජයේ ගිවිසුමට වඩා වෙනස්ය. එවැනි වෙනස්කම් තුනක් ලියන්න.
   iii. දස පනත අනුසාර කර ගනිමින් පාසල් දරුවකු වශයෙන්ම ඔබට කළ හැකි සේවාවන් පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

6. i. මරිය තුමියට ගෞරව කිරීම සඳහා ශුද්ධ වූ සභා මාතාව විසින් පවත්වන මංගල්‍යාන් දෙකක් නම් කරන්න.
   ii. මරියතුමියට අප ගෞරව කිරීමට හේතුවන කරුණු 3 ක් නම් කරන්න.
   iii. මරියතුමියගේ ජීවිත ආදර්ශය අනුව වර්තමාන සමාජය වෙනුවෙන් ඔබට කළහැකි සේවාවන් 5 ක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

7. පහත මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   i. ගරු මයිකල් රොද්‍රිගෝ (නි. ම. නි.) පියතුමා
   ii. පිරිසිදු ජීවිතයක් ගත කරන්නට අපට මඟ පෙන්වන දේව පනත් දෙක
   iii. ප්‍රාග් ඉතිහාසය
   iv. ශුද්ධ වූ සභාවේ පළමු ශික්ෂා පදය සුරකිමු